VIDUS 18-1/2-25

# කාර්මික හා තාක්ෂණික තොරතුරු සේවා මධ්‍යස්ථානයෙහි කාර්යභාරය

**තාලිතී ද සිල්වා**
*අධ්‍යක්ෂිකා,*
කාර්මික සහ තාක්ෂණික තොරතුරු මධ්‍යස්ථානය
ශ්‍රී ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

ඕනෑම රටක ආර්ථික සංවර්ධනය කෙරෙහි කෘෂිකාර්මික සහ කාර්මික සංවර්ධනය විශේෂයෙන් බලපා ඇත.ඊට අමතරව එවැනි සංවර්ධනයක් සඳහා අවශ්‍ය තොරතුරු නැතහොත් දැනුම් හිමි රටවල් සීඝ්‍ර දියුණුවක් කරා එළඹී ඇත. මෙහිදී කාර්මික සහ තාක්ෂණික තොරතුරු. ප්‍රමුඛස්ථානයක් ගෙන ඇත.

ශ්‍රී ලංකාවේද ඉහතකී කාර්මික හා තාක්ෂණික තොරතුරු ලබා දෙන රජයේ හා රජයේ නොවන ආයතන රැසක්වේ. උදහරණයක් ලෙස ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ආයතනය (CISIR) ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB) ජාතික ඉංජිනේරු පර්යේෂණ සංවර්ධන මධ්‍යස්ථානය (NERD) කටුබැද්ද විශ්ව විද්‍යාලය. ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශය (SLSI) දැක්විය හැක. මෙම කාර්මික හා තාක්ෂණික තොරතුරු ආයතනයන්හි කාර්යභාරය පිළිබඳව කර්මාන්තකරුවන්. විද්වතුන්. ව්‍යවසායකයින්. පර්යේෂකයින් හා පාසල් සිසුන්ද දැනුවත්වීම වැදගත්වේ.

1989 දී කාර්මික හා තාක්ෂණික තොරතුරු සේවා මධ්‍යස්ථානය (CITIS) ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය යටතේ ස්ථාපනයවී ඇත. 1969 දී කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත නංවාලීම සඳහා පිහිටුවන ලද ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය යටතේ පවත්නා ආයතනයකි.

මෙම කාර්මික හා තාක්ෂණික තොරතුරු සේවා මධ්‍යස්ථානය අංශ කිහිපයකින් සමන්විත වේ. එනම් පුස්තකාලය. පරිගණක අංශය. තොරතුරු සේවා අංශය. ප්‍රචාරක හා ප්‍රකාශන අංශයයි.

**සම්පත් හා සේවා**

කාර්මික හා තාක්ෂණික ක්ෂෙත්‍රයට අදාලවූ පොත්පත්. වාරසඟරා. ව්‍යාපෘති වාර්තා 15.000 ක් පමණ පුස්තකාලයේ ඇත. ඊට අමතරව මුද්‍රිත නොවන මාධ්‍ය එනම්. වීඩියෝ පට

40 ක් ද. CD - ROM 06 ක් සූක්ෂම දර්ශක 834 කින් ද සමන්විතය. මෙම පුස්තකාල සම්පත් පොදු විමර්ශනය සඳහා පහසුකම් ලබාදී ඇති අතර. දළ වශයෙන් දිනකට පාඨකයෝ 100 ක් පමණ පැමිණෙති. මෙම පුස්තකාල සම්පත් වර්ධනයේ දී කෘෂි ආශ්‍රිත කර්මාන්ත. රසායනික කර්මාන්ත. සැලසුම්. සගන්ධ තෙල් ආහාර නිෂ්පාදන කර්මාන්ත බලශක්තිය. රබර් හා ප්ලාස්ටික්. පල්ප සහ කඩදාසි. රෙදිපිළි. දැව හා දැව නිෂ්පාදන. ඉදිකිරීම්. සම්. අලෙවිය. කළමනාකරණ. යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව. විදුලි ඉංජිනේරු විද්‍යාව. ඇසුරුම් කර්මාන්ත සහ උපකරණ යනාදී විෂයයන් සඳහා විශේෂ අවධානයක් යොමු කෙරේ.

මේ හැරුණු විට ඉහත සම්පත් හා බාහිර තොරතුරු මූලාශ්‍ර ආශ්‍රයෙන් ගොඩනගා ගන්නා ලද පරිගණක ගතකරන ලද තොරතුරු හා දත්ත සමුදයක් වේ. දැනට මෙම දත්ත යන්ත්‍රෝපකරණ. කර්මාන්ත. පුස්තකාල සම්පත් පිළිබඳව ග්‍රන්ථ විඥාපන තොරතුරු හා කර්මාන්ත සංවර්ධන ආයතන යනාදී තොරතුරු ආවරණය කෙරේ. පරිගණක අංශය විසින් මෙම දත්ත සමුදය යාවත්කාලීනව පවත්වා ගෙන යාමේ කටයුතු කරනු ලබන අතර. කාර්මික සංවර්ධන මණ්ඩලයේ සෙසු අංශ සඳහා අවශ්‍ය පරිගණක ප්‍රක්‍රම (programmes) සකස් කිරීමේ කාර්යෙහිද නිරතවනු ලැබේ.

මෙම මධ්‍යස්ථාන ලේසර් මුද්‍රණ යන්ත්‍රයක්. ජායා පිටපත් යන්ත්‍රයක්. සූක්ෂම දර්ශක කියවන උපකරණයක්. කුඩා 313 ඕෆ්සෙට් යන්ත්‍රයක් සහ Digital duplicating යන්ත්‍රයක්. වීඩියෝ යන්ත්‍රයක්. ඕවර්හෙඩ් ප්‍රොජෙක්ටරයක් යනාදී උපකරණ සහ පරිගණක පහසුකම් වලින්ද සමන්විත වේ.

මේ හැරුණුවිට මෙම කාර්මික තාක්ෂණවේදී තොරතුරු සේවා මධ්‍යසථානයේ සේවයට කැපවූ කාර්ය මණ්ඩලයකින්ද යුක්ත ්වේ.

**සේවා**

කාර්මික හා තාක්ෂණවේදී තොරතුරු සේවා මධ්‍යස්ථානයේ පුස්තකාලයේ ඇති සම්පත් ශ්‍රී ලංකාවේ එම ක්ෂෙත්‍රයේ පවත්නා අග්‍රගන්‍යයේ එකතුවකි. මෙය විමර්ශනය සඳහා නොමිලේ පහසුකම් සලසා ඇති අතර. ජායා පිටපත් සහ පරිගණක පිටපත් ලබා ගැනීමේ පහසුවද සලසා ඇත. සතියේ දිනවල පෙ.ව. 8.00 සිට ප.ව. 4.45 දක්වා පමණක් විවෘතව ඇත. සාමාන්‍ය විමර්ශන සේවාවට අමතරව රු. 100/- ක වාර්ෂික සාමාජිකත්වය ලබා ගැනීමෙන් නොකඩවා ඔබේ නිවසට තොරතුරු සැපයීමේ සේවාවක්ද වේ. (IIS membership) කාර්මික සංවර්ධන මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට හැර මෙහි පොත්පත්. වාරසඟරා බැහැර ගෙන යාමට පහසුකම් නොවුවද ආයතනික සාමාජිකත්වය ලබා අන්තර් පුස්තකාල හුවමාරු සේවාව යටතේ අවශ්‍ය ආයතනවලට නිකුත් කිරීමද සිදු කෙරේ. කාර්මික තොරතුරු සැපයීම හා විස්තාරණීය සේවා විවිධාකාරයට සිදු කෙරේ. පිළිතුරු සේවාව. ප්‍රකාශන හා අත් පත්‍රිකා අලෙවිය. ප්‍රදර්ශන කටයුතු ආදී සේවාවන් මෙම මධ්‍යස්ථානයන් විසින් පවත්වාගෙන යනු ලැබේ.

ප්‍රශ්න හා පිළිතුරු සේවය යටතේ ඉහත දැක්වූ කර්මාන්ත ක්ෂේත්‍රයන්ට අදාලව ඔබට අවශ්‍ය කරුණු පෞද්ගලිකව. ලිඛිතව දුරකථන පනිවිඩ මාර්ගයෙන් හෝ ෆැක්ස් මගින් විමසීමටත් ඒ අනුව පිළිතුරු සැපයීමත් වේ. මෙම පිළිතුරු අප සතු සම්පත් ආශ්‍රයෙන් ලබා දෙනු ලැබේ. මේ සඳහා විමසීම් අනුව සුළු අයකිරීමක් කරනු ලැබේ. තවද. පුස්තකාලයට අයත් කරගනු ලබන නවතම පොත්පත් හා වැදගත් ලිපි. ලිපි අනුක්‍රමණිකතාවක් "නවතම දැනුම සේවය" යනුවෙන් පුස්තකාල සාමාජිකයින් වෙත ලබා දෙනු ලැබේ. එසේම කිසියම් කර්මාන්තයක් අළලා පාඨකයින්ට අවශ්‍ය පරිදි තොරතුරු ගොනුවක් සැපයීමටත් ඒ සඳහා මුදලක් අය කිරීමටත් කටයුතු යොද ඇත. මෙම තොරතුරු ගොනුව තාක්ෂණික ක්‍රියාවලිය. අමුද්‍රව්‍ය. වෙළඳපොළ. යන්ත්‍රසූත්‍ර හා ඒවා සපයන ආයතන ආදී තොරතුරු අඩංගු වූවකි.

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් සංවිධානය කරනු ලබන තාක්ෂණික වැඩමුළු අළලා සම්පාදිත අත්පොත් මුද්‍රණය කිරීම හා අලෙවියද මෙම අංශයෙන් සිදු කෙරේ. මෙයට අමතරව කර්මාන්ත පුවත් හා කර්මාන්ත සඟරාව සම්පාදනය හා බෙද හැරීමද සිදු කෙරේ. එසේම විවිධ කර්මාන්ත අළලා සැකසුනු අත් පත්‍රිකා සම්පාදය හා අලෙවියද විවිධ පලාත්වාසීන් සඳහා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ සේවා අළලා ප්‍රදර්ශන සංවිධාන හා වෙනත් ප්‍රචාරාත්මක වැඩසටහන් සංවිධානය කිරීමද කරනු ලැබේ.

දැනට කාර්මික හා තාක්ෂණික තොරතුරු සේවා මධ්‍යස්ථානය දේශීය තොරතුරු ජාල එනම් නරේසා ආයතනය (SLISTINET) හා ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ APPINESS ජාල හා සම්බන්ධ වී ඇති අතර. TECHINET තොරතුරු ජාලයේ මව් ආයතනය වශයෙන් ශ්‍රී ලංකාවේ කාර්මික හා තාක්ෂණික තොරතුරු සේවා සම්බන්ධීකරණය කිරීමේ වගකීමද පැවරී ඇත.

කාර්මික තාක්ෂණික තොරතුරු මධ්‍යස්ථානය INTERNET නැමති අන්තර් ජාතික තොරතුරු ජාල පද්ධතියට පිවිසීමටත් E-mail සේවය ලබා ගැනීමට අවශ්‍ය අඩිතාලම දැනටම යොද ඇත. මෙයින් වඩාත් පුළුල් සේවයක් කාර්මිකයන්ට හා ව්‍යවසායකයින්ට ලබා දීමත්. ශ්‍රී ලංකාවේ කාර්මික සංවර්ධනයට අවශ්‍ය සහාය ලබාදීම අපගේ අධිෂ්ඨානය වේ.